**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2020**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියාමන සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියාමන සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියාමන සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියාමන සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නියාමන සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියාමන සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියාමන සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව නියාමන සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 | | |
| (i) ප්‍රමිතයේ 21(ඊ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාතමක සටහන් ඉදිරිපත්කර නොතිබුණු අතර ප්‍රමිතයේ 132 (අ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මිනුම්කරණ පදනම් හෙළිදරව්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ආයතනයට අදාළවන මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කළ බව හා මිනුම්කරණ පදනම් ලෙස අතීත කාල පිරිවැය අගය සහ වර්තමාන අගය යන අගයන් 2 පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) ප්‍රමිතයේ 150 (අ) සිට (ඇ) දක්වා වූ ඡේද ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන සමඟ අස්ථිත්වයේ නිත්‍ය පිහිටි ස්ථානය, නෛතික ස්වාභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, මෙහෙයුම් ස්වාභාවය සහ එහි ප්‍රධාන | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත යටතේ පිහිටුවා ඇති පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව , අංක 2 A, CBM House, 4 වන මහල, වැව පාර, කොළඹ 08 යන ලිපිනයේ ස්ථාපිත බව හා පෞද්ගලික වෛද්‍ය | -එම- |

| | | |
|---|---|---|
| කටයුතුවල විස්තරයක්, මෙහෙයුම් කටයුතු පාලනය කිරීමට අදාළවන ව්‍යවස්ථාව පිළිබඳ යොමුව, පාලන අස්ථිත්වයේ නම පිළිබඳව විස්තර හෙළිදරව් කළ යුතු වුවද, එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ආයතනවල ලියාපදිංචිය සිදුකිරීම හා ඒවා නියාමනය කිරීම සඳහා පනතින් ලබාදී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරන බව. | |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව, සභාවේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.22,285,000 ක් වර්ගීකරණය කර දක්වා නොතිබුණි. | මුළු ආදායම් වර්ගීකරණය සඳහා ලියාපදිංචි ගාස්තු පදනම්ව රෝහල් වර්ගීකරණය කිරීම හඳුනාගැනීමට, බැංකු තැන්පතු පතක් හඳුන්වාදී ඇති අතර එය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යුත් ක්‍රමයට ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය එම ක්‍රමවේදය යටතේ සිදුකිරීමට බලාපොරොත්තු වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම සඳහා ක්‍රමවේදයක් නියාමන සභාව විසින් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 329 කදී සෘජුවම බැංකුවට ලැබී තිබුණු එකතුව රු.3,517,100 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබුණි. | එවකට තිබුණු බැංකු ගත මුදල් හඳුනාගැනීමේ ක්‍රමවේදයේ පැවති දුර්වලතා නිසා මෙම දෝෂය සිදුව ඇති බව හා ඉදිරියේදී ක්‍රියාත්මක කරන විද්‍යුත් ලියාපදිංචි ක්‍රමවේදය මගින් මෙම ගැටලුව නිරාකරණය කිරීමට පියවර ගන්නා බව. | බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් හඳුනාගෙන නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේ සිට සලසා නොතිබුණු සේවක පාරිතෝෂික ප්‍රතිපාදන වෙනුවෙන් රු.1,249,062 ක් සමාලෝචිත වර්ෂය තුළදී වෙන්කර තිබුණු නමුත් ඉන් ඉකුත් වර්ෂවලට අදාළ රු.871,242 ක් සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවද ඒ වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. එසේම එම ප්‍රතිපාදනය ජංගම නොවන වගකීම් යටතේ හෙළදරව් කළ යුතු වුවද ඒ වෙනුවට ජංගම වගකීම් යටතේ හෙළිදරව් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. | සේවක පාරිතෝෂික ප්‍රතිපාදනය ජංගම නොවන වගකීම් යටතේ හෙළදරව් කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය රු.352,921 ක් ජංගම වත්කම්වල මුදල් හා මුදල් වලට සමාන දෑ යටතේ හෙළදරව් කළ යුතු වුවද, ඒ වෙනුවට වෙනම හෙළදරව් කර තිබුණි. | දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය මුදල් හා මුදල් වලට සමාන දෑ යටතේ හෙළදරව් කළ යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ජංගම වත්කම්වල රු.34,278,827 ක ඍණ ශේෂයක් පැවති බැවින් නියාමන සභාවේ කෙටිකාලීන බුන්වත්භාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේම 2017 වර්ෂයේ සිට නියාමන සභාව අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.33,719,154 ක සමුච්චිත අරමුදල 2020 දෙසැම්බර් 31 දින වන විට රු.15,756,616 ක් දක්වා සියයට 53 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණි. | වාර්ෂික ආදායම අඩුවීමට විසඳුමක් ලෙස ලියාපදිංචි අදායම වැඩිකිරීම සඳහා අදාළ සැලසුම් මේ වන විටත් පිළියෙල කර ක්‍රියාත්මක කරමින් පවතින බව. | රට තුළ ක්‍රියාත්මක සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කර ආදායම වැඩි කර ගැනීමටත් ආයතනයේ වියදම් අවම කර ගැනීමටත් කටයුතු කරමින් කෙටිකාලීන බුන්වත්භාවයෙන් මිදීමටත් අඛණ්ඩව අලාභ ලැබීම අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| අරමුදල් මාරු ගිණුම | 232,400 | උපලේඛන | අරමුදල් මාරු කිරීමේ ගිණුමේ මෙතෙක් හඳුනාගත නොහැකි වූ මුදල පිළිබඳව කාර්යාල කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මෙම ශේෂය සඳහා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාමන සභාව මගින් අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු ආදායමෙන් පළාත් සභා වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 50 ක මුදලින් රු.34,990,820 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් අදාළ පළාත් සභාව වෙත ප්‍රේෂණය කර ඇති බව, නමුත් 2012 වර්ෂයේ සිට එක් එක් පළාත් සභාවෙන් ඉදිරිපත් කරන පෞද්ගලික සෞඛ්‍ය සංවර්ධන කටයුතු සඳහා යොමුකරන යෝජනාවලිය හා එහි ප්‍රගතිය සලකා මුදල් ප්‍රේෂණය කරන බව, මේ සම්බන්ධව 2021 පෙබරවාරි මාසික සමුළුවේදී වැඩි දුරටත් සාකච්ඡා කළ බව හා සභාවේ තීරණය පරිදි නීති උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බව. | මේ සම්බන්ධයෙන් පනතේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දින වන විට රු.44,770,520 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | නිරීක්ෂණය අපැහැදිලි බව. | මුදල් පනතේ 11 වන වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 135, 136 හා 262(2) | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව, මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී අනුමත නොකළ ගෙවීම් වවුචර් 243 ක් සඳහා රු.15,925,517 ක් ගෙවා තිබුණි. තවද ගෙවීම් වවුචර් මුදල් පොතේ සටහන් කළ දිනය "ගෙවන ලදී" මුද්‍රාව තුළ තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මේ වන විට කටයුතු කර ඇති බව හා මූල්‍ය බලතල පැවරීම පරික්ෂා කිරීම හා අනුමත කිරීම සඳහා නිලධාරීන්ට බලතල පැවරීම සිදුකර ඇති බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් මෙම වර්ෂය අවසානයේදී පැවැත්වීමට බලාපොරොත්තු වන බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 3.8 හා 3.14 වගන්ති | උත්සව අත්තිකාරම් හා බැංකු මගින් ලබාදෙන ණය හැර සෑම ණය මුදලක් වෙනුවෙන්ම සියයට 4.2 බැගින් පොලියක් මාසපතා අය කළ යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී | 2021 වර්ෂයේ සිට සේවක ණය සඳහා සියයට 4.2 ක පොලී අනුපාතයක් අය කිරීමට තීරණය කර ඇති බව හා විධිමත් ගිවිසුමක් අත්සන් කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | | නිකුත් කර තිබුණු රු.2,446,666 ක සේවක ණය වෙනුවෙන් පොලී අයකර නොතිබුණි. තවද ණය දීමට පෙර 272 වැනි පොදු ආකෘති පත්‍රවල ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, එපරිදි ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | | විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී/03/2018 හා 2020 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී/03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේ හැකියාවක් නොතිබුණු නමුත් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි 2020 වර්ෂය වෙනුවෙන් රු.148,500 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | කළමනාකරණ කමිටුවේ මාසික කමිටු අනුමැතිය ඇතිව සේවක කාර්ය සාධනය සලකා බලා ප්‍රසාද දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2006 ජුනි 06 දිනැති අංක 10/2006 හා 2007 නොවැම්බර් 01 දිනැති අංක 24/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | අංක 10/2006 දරන චක්‍රලේඛය අංක 24/2007 දරන චක්‍රලේඛය මගින් අවලංගු කර තිබියදී ඒ පිළිබඳ අවධානය යොමු නොකර නිලධාරීන්ගේ ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් රු.210,262 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | සීමිත සේවක සංඛ්‍යාවක් සිටින බැවින් ඔවුන්ගේ දිරිගැන්වීම, පැමිණීමේ ප්‍රවනතාවය දියුණු කිරීම සඳහා සේවකයන්ගේ ඉතිරිකරගත් නිවාඩු සඳහා දීමනාවක් සභාවේ තීරණය පරිදි ගෙවූ බව. | -එම- |
| (ඊ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් රාජ්‍ය නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු බැවින් 2020 ජූලි 24 දින රු.57,240 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු නමුත් එය 2021 අප්‍රේල් 27 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | දැනට රටේ පවතින කොරෝනා වසංගත තත්වය හමුවේ අප ආයතනය තුළ තාවකාලිකව ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය භාවිතා නොකිරීමට කටයුතු කළ බව හා වසංගත තත්වය පහව ගිය පසු ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීමට බලාපොරොත්තු වන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයෙහි පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එහි පිටපතක් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයෙහි පිටපතක් කළමනාකරණ කමිටුව විසින් මාසික කමිටු අනුමැතිය ඇතිව 2020 වර්ෂයේ සිට පිළියෙල කර ඇති බව | අනුමත කරන ලද වාර්ෂික අයවැයෙහි පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය |
| (ඌ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/1/4/2014/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය | දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පනතේ සඳහන් අරමුණු සක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2020 වර්ෂයට අදාළව පිළියෙල කර සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කළමනාකරණ කමිටුව විසින් මාසික කමිටු අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (එ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය | අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, නියාමන සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කළමනාකරණ කමිටුව විසින් මාසික කමිටු අනුමැතිය ඇතිව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,048,680 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු.3,280,313 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,768,367 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වාර්ෂිකව නියාමන සභාවේ ලියාපදිංචි විය යුතු පෞද්ගලික රෝහල්, රසායනාගාර, යනාදියේ ලියාපදිංචිය අඩුවීම සහ එලෙස ලියාපදිංචි නොවූ ආයතන සම්බන්ධයෙන් විමර්ශනය නොකිරීම යනාදී කරුණු ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

------------------------------------------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා නියාමන සභාව විසින් රැස් කර තිබුණු මුළු ආදායම රු.27,647,089 ක් වූ අතර ඉකුත් වර්ෂයේ මුළු ආදායම රු.30,122,360 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.2,475,271 ක් හෙවත් සීයයට 8.22 ක ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ නියාමන සභාව විසින් වැයකර තිබුණු මුළු වියදම රු.33,695,769 ක් වූ අතර ඉකුත් වර්ෂයේ වියදම රු.33,402,673 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.293,096 කින් වියදම වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 කාර්යසාධනය

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ පළාත් 07 ක පමණක් 2020 දෙසැම්බර් 31 දින වන විට පෞද්ගලික වෛද්‍ය ආයතන 2,443 ක් ස්ථාපිත කර තිබුණු අතර දකුණු පළාත හා උතුරු මැද යන පළාත් දෙකෙහි ස්ථාපිත පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,176 ක් පමණක් විය. | ලියාපදිංචිය නොලබා පවත්වගෙන යනු ලබන පෞද්ගලික වෛද්‍ය ආයතනයන් හඳුනා ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා මෙන් අදාල පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත මේ වන විටත් උපදෙස් ලබා දී ඇති බව. | දිවයින පුරා ස්ථාපිත සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) යථෝක්ත පනතේ 9 වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීමට හා අධීක්ෂණය කිරීමට, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීමට හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට සහ | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදී හා ලියාපදිංචිය වාර්ෂිකව යාවත්කාලීන කිරීමේදී එම ආයතන ඒ ඒ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ සුදුසුකම් ලත් නිලධාරී මණ්ඩලයක් විසින් අධීක්ෂණය කරන බව හා ඉන් අනතුරුව එම ලියාපදිංචිය සඳහා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව වෙත යොමුකරන | පනතේ 9 වගන්තිය ප්‍රකාරව කටයුතු නිමකර ගැනීමට අපොහොසත්වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අදාළ මාර්ගෝපදේශ රෙගුලාසි බවට පත්කර |

| | | | |
|---|---|---|---|
| | සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට හා කාර්යයන් ඉටුකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත්වී තිබුණි. | බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | යථෝක්ත පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතීතනය යටතේ පෞද්ගලික රෝහල් ශ්‍රේණි ගත කිරීම මේ වනවිටත් ආරම්භ කර ඇති බව හා සභාව ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙළ කිරීම, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම හා ඒවා රෙගුලාසි බවට පත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතනය සඳහා යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | යථෝක්ත පනතේ 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව මහජනතාවගේ ගැටළු ඉදිරිපත් කිරීමට හැකි අතර ඒ සඳහා කටයුතු කිරීමට නිසි මාර්ගෝපදේශයක් සකස්කොට ඇති බව. | පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාමන සභාව විසින් එකතු කරනු ලබන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට පනහක් පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ලබාදීමට ප්‍රථම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සමඟ වාර්ෂික යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට හා වර්ෂය අවසානයට වියදම් හා ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට වූ විධිවිධාන ඇතුළත් කරමින් යථෝක්ථ පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට 2015 ජූලි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය | මේ සම්බන්ධයෙන් සභාවේ මාසික රැස්වීමේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව නීතිමය උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වන බව හා 2015 ජූලි 09 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට අපේක්ෂා කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ 05 ක් ගතවී තිබුණද පනත සංශෝධනය කර නොතිබුණු අතර වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් වෙත ලබාදී තිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලියාපදිංචි විය යුතු නිශ්චිත කාල වකවානුවක් පනතේ හෝ නියමු උපදේශන මගින් සඳහන් කර නොතිබීම හේතුවෙන් වෛද්‍ය ආයතන ලියාපදිංචිය වෙනුවෙන් කවර දිනක හෝ මුදල් ලද පසු අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සිදු කර තිබුණු අතර දඩ මුදලක් අයකර නොතිබීම හේතුවෙන් වර්ෂය මුලදී සභාවට ලැබිය යුතු ආදායම ප්‍රමාදවී ලැබී තිබුණි. | ලියාපදිංචි කිරීමේදී සිදුවන ප්‍රායෝගික ගැටළු කිහිපයක් හඳුනාගෙන ඇති බව හා එම ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව, ඉදිරියේදී ප්‍රමාදවී ලියාපදිංචි වන ආයතනවලින් දඩ මුදලක් අයකර ගැනීමට බලාපොරොත්තු වන බව. | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු නිශ්චිත කාලවකවානුවක් තීරණය කර එම කාලවකවානුව තුළ ලියාපදිංචි නොවන ආයතන වලින් දඩ මුදලක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව, එකතු කරන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් එක් එක් පළාත් සභාව වෙත යවනු ලැබිය යුතුය. නමුත් නියාමන සභාව විසින් ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභා අරමුදලට බැර කිරීම පිණිස පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ප්‍රේෂණය නොකර ඒ වෙනුවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත ප්‍රේෂණය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එක් එක් පළාත් සභා වෙත යවා තිබුණු රු.2,679,250 ක් අදාළ පළාත් සභා අරමුදලට බැරවී නොතිබුණි. | සභාවේ අනුමැතිය ඇතිව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත මුදල් ප්‍රේෂණය කළ බව හා තවදුරටත් මේ සම්බන්ධයෙන් සභාවේ මාසික රැස්වීමේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභාවල වියදම් දැරීමට කිසිදු විධිවිධානයක් පනතේ සලසා නොතිබුණු නමුත් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ගේ දුරකථන දීමනා, ප්‍රවාහන වියදම් සහ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,589,629 ක් නියාමන සභාව විසින් ගෙවා තිබුණි. යථෝක්ත පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු ආදායමෙන් එම මුදල අඩු කරගෙන තිබුණි. | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට අනුයුක්තව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති වෛද්‍යවරියට හා කාර්යමණ්ඩලයට අදාළ වැටුප් හා ගෙවීම් සිදු කරනු ලබන්නේ එම පළාත් සභාවට ගෙවීමට නියමිතව ඇති සියයට 50 මුදලින් බව. | -එම- |
| (ඇ) | පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවක පිරිස් පුහුණු කිරීමට නියාමන සභාව වෙත පනතින් බලය ලැබී නොතිබුණු නමුත්, පෞද්ගලික රෝහල්වල සේවයේ නිරත හෙද නිලධාරීන් සඳහා Refresher Gap Filling Course නමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට 2014 මැයි 30 දින පෞද්ගලික ආරෝග්‍යශාලා සහ සාත්තු නිවාස සංගමය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා එක්ව වර්ෂ 5 ක කාල සීමාවක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර එම පුහුණු වැඩසටහන සඳහා ඉකුත් වර්ෂය තුළදී රු.2,424,698 ක්ද, සමාලෝචිත වර්ෂය තුළදී රු.540,484 ක්ද වැයකර තිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ අරමුණු ප්‍රකාරව, පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් රෝගීන්ට ලබා දෙන සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සිදුකළ යුතු බව සභාව විසින් හඳුනා ගෙන ඇති බව, .ඒ අනුව පෞද්ගලික වෛද්‍ය ආයතනවල හෙද කාර්ය මණ්ඩල පුහුණුකර ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා සභාවේ පූර්ණ අනුමැතිය සහිතව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ බව හා මෙම වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉදිරි මාසික සභා රැස්වීමේදී තව දුරටත් සාකච්ඡා කිරීමට නියමිත බව. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |
| (ඈ) | නියාමන සභාව යටතේ ලියාපදිංචි කරන පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලියාපදිංචිය ප්‍රදර්ශනය කරමින් නාම පුවරු ගැසීම නියාමන සභාවේ කාර්යයක් නොවූවද, 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 10 කදී, අළුත් නාමපුවරු සකස් කිරීම හා පැරණි නාම පුවරු නැවත සැකසීම (Refill) සඳහා නියාමන සභාව විසින් රු.16,220,719 ක් වැය කර තිබුණි. | අලුතින් ලියාපදිංචි වන පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා නාම පුවරු සකස් කිරීම 2007 වර්ෂයේ සිට මේ වන තෙක් සිදුකෙරෙමින් පවතින බව හා එය ප්‍රදර්ශනය කිරීම මගින් ලියාපදිංචි පෞද්ගලික ආයතන මහජනතාවට හඳුනා ගැනීමට ඉඩ සලසා, එමගින් විශ්වාසය සුරක්ෂිත කිරීමට බලාපොරොත්තු වන බව. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |
| (ඉ) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අදාළ කර ගත හැකි බවට එම චක්‍රලේඛයේ ඇමුණුම 01 හි සඳහන් ආයතන ලැයිස්තුව තුළ නියාමන සභාව නොතිබුණු බැවින්, එම චක්‍රලේඛය මගින් නිර්දේශ කර තිබුණු වැටුප් සංශෝධනය නියාමන සභාවට අනුගත කළ නොහැකි වුවද, එම චක්‍රලේඛය ප්‍රකාරව සියළු නිලධාරීන් වෙත වැටුප් වැඩිවීමක් ලබාදී තිබුණි. | සේවක බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙළ කරන ලද විශේෂ මණ්ඩලයේ නිර්දේශ අනුව සේවක වැටුප් 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පාදක කොට ගෙවීමට සභාව තීරණය කරන ලදී. | මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගත යුතුය |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියාමන සභාව ආරම්භ කළ වර්ෂයේ සිටම සභාව සතු කාර්යභාරය හා එහි ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ආරම්භයේ සිට නිලධාරීන් දෙදෙනෙකු පමණක් නියුතු ආයතනය විධිමත්ව පවත්වා ගෙන යාමට වරින් වර නිසි ක්‍රමවේදයකට අනුව සේවකයන් බඳවා ගත් බව හා ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කරගත් නමුත් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් බව. | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා ඒ අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂවලදී බාහිර පාර්ශවයක් වෙත රු.370,300 ක් ගෙවා පිළියෙල කරවා ගෙන තිබුණු බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට 2020 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කරගත් නමුත් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් බව. | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජ්/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, නියාමන සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | විගණන කමිටුව සඳහා සාමාජිකයන් පත්කළ බව හා ඉදිරියේදී විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | විගණන කමිටුව සඳහා සාමාජිකයන් පත්කළ බව හා ඉදිරියේදී විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව දැනුවත්වී නොතිබුණු බව හා ඉදිරියේදී අදාළ දර්ශකයන් හඳුනා ගෙන කටයුතු කරන බව. | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව දැනුවත්වී තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද නාගැනීමට කටයුතු කළ යුතුය. |